PR/2018/31S

ජපන් ජනතාවගෙනි
ஜப்பானிய மக்களிடமிருந்து
From the People of Japan


**ජපන් තානාපති කාර්යාලය**

අංක 20, ශ්‍රීමත් ආර්. ජී. සේනානායක මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව

දුරකථනය (+94-11-2693831~3, ෆැක්ස් (+94-11-2698629)

ඊමේල්: cultujpn@co.mofa.go.jp


**පුවත්පත් නිවේදනය**

2018 නොවැම්බර් මස 05 වන දින

# ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයන්හි, බිම්බෝම්බ ඉවත් කිරීමේ මානුෂික මෙහෙයුමට ජපානයෙන් ආධාර

ජපන් රජය මගින් ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ ක්‍රියාත්මක වන බිම්බෝම්බ ඉවත් කිරීමේ මානුෂික මෙහෙයුම සඳහා, බිම් මට්ටමේ මානව ආරක්ෂණය සඳහා වන ආධාර ව්‍යාපාතිය (GGP) යටතේ රුපියල් මිලියන 97 ක (ඇමරිකානු ඩොලර් 625,000 ක) ආධාර මුදලක් ලබා දීමට තීරණය කර ඇත. මේ සඳහා වන ගිවිසුමට කොළඹ පිහිටි ජපන් තානාපති නිළ නිවසේදී 2018 නොවැම්බර් මස 05 වන දින ජපන් තානාපති ගරු අකිරා සුගියාමා මැතිතුමා සහ ද හේලෝ ට්‍රස්ට් (The HALO Trust- සංවිධානයේ වැඩබලන වැඩසටහන් කළමණාකාර මයිකල් ඩයර් මහතා ද අත්සන් තැබීය.

ද හේලෝ ට්‍රස්ට් (The HALO Trust) විසින් ක්‍රියාත්මක කළ "ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයන්හි ජීවනෝපායයන් ගොඩනැගීම හා නැවත පදිංචි කිරීම සඳහා වන බිම්බෝම්බ ඉවත් කිරීමේ මානුෂික මෙහෙවර සඳහා වු ව්‍යාපාතිය" මගින් අවතැන් වූ උතුරේ ජනතාවට නැවත පදිංචියට පැමිණ තම ජීවිකාවන් ආරම්භ කිරීම සඳහා ශ්‍රී ලංකා රජය මගින් ක්‍රියාත්මක වන බිම්බෝම්බ වලින් තොර ආරක්ෂිත ප්‍රදේශ ඇති කිරීමේ වැඩපිළිවෙල තවදුරටත් වේගවත් කරනු ඇත. හේලෝ ට්‍රස්ට් සංවිධානය ලොව විශාලම සහ පරිණත බිම්බෝම්බ ඉවත් කිරීමේ මානුෂිය මෙහෙවර සඳහා ආධාර ලබාදෙන රාජ්‍ය නොවන සංවිධානයක් වන අතර එය යාපනය, කිලිනොච්චි සහ මූලතිව් යන දිස්ත්‍රික්ක වල බිම්බෝම්බ ඉවත් කිරීමේ මානුෂික මෙහෙවරහි යෙදීමට නියමිතව ඇත.

ශ්‍රී ලංකාවේ අවතැන් වු පුද්ගලයන් නැවත පදිංචි කිරීමටත්, ඔවුන්ගේ කාෂිකාර්මික කටයුතු නැවත ආරම්භ කිරීමටත්, එමෙන්ම වෙනත් ජීවනෝපායන් ආරම්භ කිරීම සඳහා මූලික කර්තව්‍යයක් වන බිම්බෝම්බ ඉවත් කිරීමේ ක්‍රියාවලියට, ජපානය විශාල ලෙස මුදල් ආධාර ලබා දී ඇත. වර්ෂ 2003 සිට උතුරු නැගෙනහිර ප්‍රදේශයන්හි බිම්බෝම්බ ඉවත් කිරීමේ කාර්යයන් සඳහා ජපානය තම ආධාර සැපයීමේ වැඩ සටහන යටතේ ආසන්න වශයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 33 ක් ලබා දී ඇත.

මේ සම්බන්ධව අදහස් දැක්වූ ද හේලෝ ට්‍රස්ට් (The HALO Trust)හි ආසියා කලාපයේ ප්‍රධානියා මැතිව් හොවෙල් (Matthew Hovell) මහතා පවසන පරිදි; “ජපානය, හේලෝ ට්‍රරස්ට් (The HALO Trust) ආයතනයේ දීර්ඝතම  දායකයා වේ. ඔහු දැක්වූයේ, බිම්බෝම්බ ඉවත් කිරීමේ මානුෂික මෙහෙයුම, තුලින් උතුරු ප්‍රදේශයන්හි නැවත පදිංචි වීම සඳහා දහස් ගණනින් පැමිණෙන පුද්ගලයන්ගේ ජීවිත හා ජීවිකාවන් ගොඩනැංවීමට හා සංහිඳියාව ඇති කිරීමට  හේතු වී ඇති බවයි. දීර්ඝ කාලයක් තිස්සේ බිම්බෝම්බ ඉවත් කිරීම සිදුකර ඇතත් තවමත් එහි ඉතිරි වී ඇති අභියෝගයන්  සුවිශේෂි වේ. ජපන් රජයෙන් හා අනෙකුත් ආධාරකරුවන්ගෙන් ලැබෙන අඛණ්ඩ සහාය මෙන්ම, ශ්‍රී ලංකා රජයෙන් ලැබෙන පිටුබලයත් සමඟ වර්ෂ 2020 වන විට එය බිම්බෝම්බ වලින් තොර ශ්‍රී ලංකාවක් බවට පත්කර ගැනීමට මහෝපකාරි වනු ඇත.


වැඩි විස්තර සඳහා කරුණාකර අමතන්න

ජපන් තානාපති කාර්යාලයේ ආර්ථික සහයෝගිතා අංශය

දුරකථන අංක 011-2693831 දිගුව 225

ර්මේල්  : cultujpn@co.mofa.go.jp